# දෙමළ ජනයා කොන්වීම

ඇමරිකාවේ වෙසෙන සමාජ විද්‍යාඥයකු යැයි කියන මහාචාර්ය එච් එල් සෙනෙවිරත්න මහතාට අනුව මෙරට දෙමළ ජනයාට අද ප්‍රශ්නයක් ඇත. ඒ අන්කිසිවක් නොව දෙමළ ජනයා මෙරට දේශපාලනයෙන් කොන්වීම ය. දයාන් ජයතිලක මහතා තම මියගිය පියා ගැන ලියූ ලිපියක (බොහෝ විට පුද්ගලයන් මියගිය පසු ඔවුන් ගැන සැමරුම් ලිපි ලිවීම දරුවන් ඇතුළු පවුලේ සමීප නෑයන්ට සීමා වී ඇත) පියා දෙමළ ජනයාගේ ප්‍රශ්නය එලෙස කොන්වීම යැයි සඳහන් කිරීමට තිබූ බව ප්‍රකාශකර තිබුණි. එච් එල් සෙනෙවිරත්න මහතා ඒ අනුමත කර ඇත. සෙනෙවිරත්න මහතා තවමත් ඇමරිකාවේ විශ්වවිද්‍යාලයක සේවය කරන්නේ දැයි මම නො දනිමි. එමෙන් ම ඔහු විසින් නිර්මාණය කරන ලද සමාජ විද්‍යා සංඝකල්පයක් හෝ ප්‍රවාදයක් හෝ ගැන ද මම නො දනිමි.

මේ කොන්වීම කුමක් ද? අවශ්‍ය නම් යමකුට දෙමළ ජනයා අද බොහෝ ක්ෂෙත්‍රවල කොන් වී ඇතැයි කිවහැකි ය. අද මෙරට විශ්වවිද්‍යාලවල (යාපනය, නැගෙනහිර, අග්නිදිග හැරුණුවිට) දෙමළ ආචාර්යවරුන් එතරම් ප්‍රමාණයක් දැකගත නො හැකි ය. එමෙන් ම වෛද්‍ය, ඉංජිනේරු ආදී වෘත්තීන්හි ද දෙමළ ජනයා ඇත්තේ අඩු සංඛ්‍යාවකි. විශ්වවිද්‍යාලවල ද බටහිර විද්‍යාව පදනම් කරගත් පීඨවල දෙමළ ශිෂ්‍ය සංඛ්‍යාව අඩු ය. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ද එතරම් දෙමළ ක්‍රීඩකයන් දක්නට නැත. ඒ තබා ටැමිල් යූනියන් නම් ක්‍රීඩා සමාජයෙහි (පී සරවනමුත්තු ක්‍රීඩාංගනය මේ ක්‍රිඩා සමාජයට අයත් ය.) ද එතරම් දෙමළ ක්‍රීඩකයන් නැත. ඒ ක්‍රිඩා සමාජයට ද සිංහල ක්‍රීඩකයෝ ක්‍රීඩාකරති. මේ එකක්වත් කොන්වීම් නොව ජනඅනුපාතය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵල ය. දෙමළ ජනයාට ඇති ප්‍රශ්නය කුමක් දැයි සොයමින් සිටි සෙනෙවිරත්න මහතාට ද අවසානයේ දී පිළිතුරක් ලැබී ඇත. ඒ කොන්වීම ය. ව්‍යාජ ප්‍රභූන්ට අනුව මේ කොන්වීම අද සමාජයෙහි ලක්ෂණයක් මිස කලින් සමාජවල ලක්ෂණයක් නොවිය හැක්කේ එදා දෙමළ ජනයාට ප්‍රශ්නයක් නොතිබි නිසා ය. වෙනත් ප්‍රශ්නවල දී මෙන් ම මෙහි දී ද අවශ්‍ය නම් මේ කොන්වීම පනස්හයෙන් පසුව සිදු වී ඇතැයි කිව හැකි ය. ඒ කෙසේ වෙතත් එකල දෙමළ ජනයා කොන් නොවූ බවත් එහෙත් අද දෙමළ ජනයා කොන්වී ඇති බවත් ඇතැමුන්ගේ නිගමනය වෙයි.

අපට මෙහි දී තවත් ප්‍රශ්නයක් ඇසිය හැකි ය. එදා සමාජයේ කොන් වූ කොටසක් වී ද? ඒ එසේ නම් ඒ කවරහු ද? එයට පිළිතුර ඉතා පැහැදිලි ය. එදා මෙරට සමස්තයක් වශයෙන් ගතහොත් ඉංගිරිසි කතානොකරන ජනයා කොන් කෙරී සිටිය හ. ඒ ඉංගිරිසි කතානොකරන ජනයාගෙන් කිනම් පිරිසක් ඒ පිළිබඳ ව සිහියෙන් (සවිඥානික ව යැයි කීමට මම මැළිවෙමි. රහත් නොවූ අපට අවිද්‍යාව වෙයි. අවිද්‍යාව ඇති තැන විඥානය ද වෙයි.) සිටියෝ ද? එයට ද ඇත්තේ පැහැදිලි පිළිතුරකි. ඒ සිංහල ජනතාව ය. විශේෂයෙන් ම සිංහල බෞද්ධ ජනතාව ය. සිංහලයන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් තමන් සමාජයේ කොන් කෙරී ඇති බව දැනගත්තේ කිනම් කාලයක ද? සිංහල බෞද්ධයන් කොන් වී ඇති බව එකල සමාජ විද්‍යාඥයන් නමින් පෙළහර පාන්නන් කියා තිබේ ද? අඩු තරමින් අද සමාජ විද්‍යාඥයෝ එදා ඉංගිරිසි කතානොකරන සිංහලයන් සමාජයේ කොන් වී සිටි බව අවධාරණය කරත් ද? මේ ප්‍රශ්නවලින් මා කියන්නට සූදානම් වන්නේ කුමක් ද යන්න බටහිර සමාජ විද්‍යාඥයකුට වුවත් පැහැදිලි විය යුතු ය.

බ්‍රිතානි යටත්විජිත යුගයේ දී තමන් කොන් කෙරී ඇති බව දැන සිටියෝ සිංහල බෞද්ධයෝ ය. 1817 සිට ම කරන ලද අරගලවල පසුබිමෙහි වූයේ මේ කොන් කෙරීම ය. මුල දී සෘජු දේශපාලන අරගලවල නිරත ව සිටි සිංහල බෞද්ධයෝ දහනව වැනි සියවස අග දී අරගලයේ සංස්කෘතික සංරචකයට වඩා වැදගත් තැනක් දුන්හ. පංච මහා වාද, අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය ආදිය මෙහි දී අපේ අවධානයට යොමු වෙයි. බ්‍රිතානීන් සමග සෘජුව දේශපාලන අරගලයක නිරතවීමට තරම් ශක්තියක් 1848න් පසුව සිංහල බෞද්ධයනට තිබී නැති බව පැහැදිලි ය.

ඊනියා නිදහස ලැබීමට පෙර සිංහල බෞද්ධයන් හැරෙන්නට බ්‍රිතානීන් සමඟ කිසියම් ආකාරයක අරගලයක් කළෝ කවරහු ද? එක් පැත්තකින් ජාතිය, ජාතිකත්වය ආදිය පැත්තකට දමා ලංකාවේ නැති කම්කරු පංතියක නායකත්වයෙන් ව්‍යාජ විප්ලවකිරීමට දැඟලූ මාක්ස්වාදීහු වූහ. ඉංගිරිසි කතාකළ කිහිප දෙනකු හා කම්කරුවන් කිහිප දෙනකු හැරෙන්නට ඔවුන්ට ද මුලින් ආකර්ෂණය වූයේ සිංහල ජාතිකත්වයකින් ඔද වැඩුණු පිරිසක් වීම අහම්බයක් නොවනවා පමණක් නොව ඒ තේරුම් ගැනීමට කසිකබල් අපෝහකයක් ද අවශ්‍ය නො වේ. පසු කලෙක ශ්‍රී ල නි ප ජාතිකත්වයේ මග ගැනීමත් සමග ඒ පිරිස මාක්ස්වාදී පක්ෂ අත්හැරියෝ ය. බ්‍රිතානීන් සමග සම්මුතිවාදී හෙවත්

© Prof. Nalin De Silva

පෙත්සම් කන්නලව්වක යෙදුණු පිරිසක් ද වූහ. ඔවුන්ට අවශ්‍ය වූයේ තමන් බ්‍රිතාන්‍යයන් වැනි යැයි පෙන්වමින් රටේ පාලනයට යම් අයුරකින් දායක වීමට ය. ඉංග්‍රීසි කතාකරන්නන් වූ මොවුන්ගේ නායකත්වය දහනව වැනි සියවස මුල දී බර්ගර්වරුන්ට හිමිවිය. මේ පිරිස බර්ගර් නායකත්වයෙන් ඊනියා ලාංකේය (සිලෝනීස්) ජාතියක් ගොඩනැගීමට උත්සාහ කළහ. ඒ ගබ්සා වූ ජාතිකත්වයක් බව තවමත් මෙරට බොහෝ ඉංග්‍රීසි කතාකරන්නන්ට හා ඔවුන් අනුව යන ඉංග්‍රීසි කතානොකරන්නට ද නො තේරෙයි.

මේ පිරිසේ නායකත්වය දහනව වැනි සියවස අගවන විට මෙරට ඉංග්‍රීසි කතාකරන දෙමළ ජනයාට හිමිවිය. එහෙත් එපමණකින් බර්ගර්වරු තමන් කොන් වූ බවක් නො සිතූහ. එමෙන් ම ඉංග්‍රීසි කතාකරන සිංහලයෝ ද තමන් කොන්වී ඇතැයි නො සිතූහ. මෙයට අමතරව මෙරට දෙමළ කතාකරන එහෙත් ඉංග්‍රීසි කතානොකරන ජනයා වූහ. ඔවුහු ද තමන් කොන් වී ඇතැයි නො සිතූහ. ඔවුන් බ්‍රිතාන්‍ය යටත්විජිත සමයෙහි දී කළ අරගලයක් ද නැත. ඔවුන්ට තමන් කොන් වී ඇතැයි සිතීමට කොන් නොවී සිටි කාලයක් ද නොමැති වීම එයට හේතුව විය. ලන්දේසීන් විසින් මෙරටට ගෙන්වන ලද මෙරට දෙමළ පමණක් කතාකරන බහුතර දෙමළ ජනයා කිසි දිනෙක පාලනයට හවුල්නොවූහ. මෙරට දෙමළ ජනයාගෙන් ඊනියා කොන්වීමට ලක් නොවී සිටියෝ ලන්දේසීන්ගෙන් හා බ්‍රිතාන්‍යයන්ගෙන් වරප්‍රසාද ලත් දෙමළ ජනයා වූහ. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයෙහි ඔවුහු ඉංග්‍රීසි කතාකළහ.

සිංහල බෞද්ධයෝ බ්‍රිතාන්‍යයන්ට ගිවිසුමකින් රට භාරදීමට පෙර කොන් නොවී සිටියහ. බ්‍රිතාන්‍ය පාලනයෙහි තමන් කොන් වී ඇති බව දැනුණේ සිංහල බෞද්ධයනට ය. එබැවින් ඔවුහු 1817 සිට සැමදාමත් සටන්කළහ. ඒ සටනෙහි එක්තරා අවධියක දී, එනම් පනස්හයට ටික කලකට පෙර සිංහලයෝ පෙර මෙන් ම සිංහල රාජ්‍ය භාෂාව විය යුතු යැයි කීහ. වෘත්තීන්හි සිංහල බෞද්ධයනට වන අසාධාරණකම් ගැන කතා කළහ. විශ්වවිද්‍යාලයෙහි විද්‍යාව පදනම් කරගත් පීඨවලට සිංහල ශිෂ්‍යයන් සියයට හතළිහට අඩුවෙන් ප්‍රවේශවීම ඔවුන්ට තේරුම් ගත නො හැකි විය. මේ උද්ඝෝෂණවල හා සටන්වල ප්‍රතිඵලය වූයේ පනස්හය ය.

1931 සර්වජන ඡන්දයත් සමග ඉංග්‍රීසි කතාකරන දෙමළ ජනයාට රටේ තම නායකත්වය නැතිවන බව තේරුම් ගියේ ය. 1913 කාලයේ සිට ම ඉංග්‍රීසි කතාකරන දෙමළ ජනයා මධ්‍යයෙහි තම නායකත්වය නැතිවීම ගැන දැන සිටියෝ ය. අරුණාචලම් තමිල් මහජන සභාව නිර්මාණය කෙළේ ඒ නායකත්වය තවදුරටත් ආරක්ෂාකර ගැනීමට ය. එහෙත් තිස්එකෙන් පසු අර්බුදය උග්‍ර විය. ඉංග්‍රීසි උගත් සිංහලයන්ට රටේ නායකත්වය හිමිවිය. පොන්නම්බලම් පනහට පනහ යෝජනාව ඉදිරිපත් කෙළේ ය. යම් අයුරකින් ඒ යෝජනාව ජයගත්තේ නම් අමාත්‍ය මණ්ඩලයේ සභාපති වන්නේ ඩී එස් සේනානායක මහතා නොව ජී ජී පොන්නම්බලම් මහතා ය. ඉංග්‍රීසි උගත් දෙමළ ජනයාට අහිමි වූයේ රටේ සමස්ත නායකත්වය පමණකි. ඔවුහු තවදුරටත් ඇමතිකම් හෙබවූහ.

එහෙත් ඉංග්‍රීසි උගත් දෙමළ ජනයා තමන්ට අමාත්‍ය මණ්ඩලයේ සභාපතිකම නැතිවීම කොන්කිරීමක් ලෙස සිතූහ. 1949 දී චෙල්වනායකම් නම් අන්තවාදියා ෆෙඩරල් නමින් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවූයේ සිංහලයන්ට උතුරු හා නැගෙනහිර පළාත් අහිමි කරමින් ඒ පළාත් දෙකෙහි නායකත්වය තමන් ට ලබාගැනීමට ය. ඒ 1956ට පෙර ය. පනස්හයේ පෙරළියෙන් පසු රට අත්හැර ගියෝ බර්ගර්වරු වූහ. ඔවුන්ට තම බලය නැතිවීමත් සමග තමන් කොන් වී ඇතැයි හැඟෙන්නට ඇත. ඒ අවස්ථාවේ ඉංග්‍රීසි කතාකරන දෙමළ ජනයාට ද තමන් කොන් වන්නේ යැයි දැනෙන්නට ඇත. මේ කොන්වීම යනු බ්‍රිතාන්‍යයන් යටතේ බර්ගර් හා ඉංග්‍රීසි කතාකරන දෙමළ යන ජනවර්ග ලැබූ වරප්‍රසාද නැතිවීමක් මිස අන්කිසිවක් නො වී ය. එතෙක් කොන් වී සිටි ඉංග්‍රීසි කතානොකළ සිංහල බෞද්ධ ජනයාට ලැබිය යුතු තැන ලැබෙන්නට පටන්ගැනීම තමන් කොන්කිරීමක් ලෙස ඉංග්‍රීසි කතාකරන දෙමළ ජනයා දුෂ්ටසහගතව සිතන්නට වූහ. පසුව චෙල්වනායගම් ඉංග්‍රීසි කතාකරන දෙමළ ජනයාගේ ඊනියා කොන්වීම ඉංග්‍රීසි කතානොකරන දෙමළ ජනයාට ද ආරෝපනය කිරීමට සමත්විය. එහි දී ඔහු යොදාගත්තේ භාෂා මාධ්‍යය මත පදනම් ව විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී ලකුණු ප්‍රමිතකිරීම ය. එහි ඇති වරද කුමක් ද? ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන දෙමළ ශිෂ්‍ය සංඛ්‍යාවේ අනුපාතය ජන අනුපාතයට අඩු නො වීය. ඊනියා කොන්වීමට විසඳුම් අනවශ්‍යය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva